

පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය පිළිබඳ
ආංශික අධීක්ෂණ කාරක සභාව
“මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට අදාල බදු ප්‍රතිපත්ති” සම්බන්ධයෙන්
වන වාර්තාව
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ,
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
කාරක සභාවේ සභාපති
2023 අගෝස්තු මස 11 වැනි සිකුරාදා

**சுற்றாடல், இயற்கை வளங்கள் மற்றும் நிலைபேறான அபிவிருத்தி பற்றிய**
**துறைசார் மேற்பார்வைக் குழு**
**“இரத்தினக்கல் மற்றும் நகை துறையினை மேம்படுத்துவது தொடர்பான வரிக் கொள்கை”**
**பற்றிய அறிக்கை**
**துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர்**
**கௌரவ அஜித் மான்னப்பெரும அவர்களினால்**
**2023 ஆகஸ்ட் மாதம் 11 ஆம் திகதி**
**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது**

Report of the
Sectoral Oversight Committee on Environment, Natural Resources and Sustainable Development
on “Tax policies for development of Gem and Jewellery sector”
Presented to Parliament by
The Hon. Ajith Mannapperuma
Chair of the Committee
On Friday 11th August 2023

**පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයින්**

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (සභාපති)
ගරු සී.බී.රත්නායක මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

**කාරක සභාව සතු බලතල**
පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවලින් එකක් වන මෙම කමිටුවට ඇති බලතල සහ ක්‍රියාකාරීත්වය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 යටතේ දක්වා ඇති අතර, එම තොරතුරු www.parliament.lk වෙබ් අඩවියෙහි ඇතුළත්ය.

**ප්‍රකාශන**
ආංශික අධීක්ෂණ කාරක සභාවන් විසින් ප්‍රකාශයට පත්කරනු ලබන වාර්තා පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා කාර්යාංශයෙන්(කාරක සභා අංක II) හෝ www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

**කාරක සභා කාර්ය මණ්ඩලය**
හංස අබේරත්න මහතා - පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්
ජනකාන්ත සිල්වා මහතා - අධ්‍යක්ෂ, ව්‍යවස්ථාදායක සේවා
මොහොමඩ් මබ්රුක් මහතා - සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
චමිලා රූපසිංහ මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි

**යොමුව සහ විමසීම්**
මෙම වාර්තාව පිළිබඳ සියළුම විමසීම් සඳහා, ලේකම්, පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය සඳහා වන ආංශික අධීක්ෂණ කාරක සභාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත යොමු කළ යුතුයි. පොදු විමසීම් සඳහා දුරකථන අංක 0112777100 අමතන්න.

පටුන

1. හැඳින්වීම

2. කාරක සභාවේ නිර්දේශ

3. කාරක සභාවට කැඳවන ලද රාජ්‍ය ආයතන

4. කාරක සභාවට කැඳවන ලද මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංගම්

<u>මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සඳහා බදු ප්‍රතිපත්තියට අදාළව පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් ඉදිරිපත් කරන වාර්තාව</u>

## 1. හැඳින්වීම

මැඩගස්කරය ආදී අප්‍රිකානු රටවලින් මෙරට මැණික් ව්‍යාපාරිකයින් ප්‍රති-අපනයනය සඳහා මැණික් ආනයනය කරන ආකාර 2කි. එනම් මැණික් ඇසුරුම අතෙහි රැගෙන ඒම සහ නියෝජිතයකු හරහා මැණික් ඇසුරුම් කුරියර් කිරීමෙනි.

මැණික් පාර්සලය අතෙහි රැගෙන ඒමේදී නිශ්කාෂණය කර ගැනීම පහසු කිරීමට ඩොලර් 200 ක මුදලක් ශ්‍රී ලංකා රේගුවට ගෙවා එය නිදහස් කර ගත හැකි ආකාරයට ක්‍රමවේදය සකස් වී ඇති අතර එලෙස ගෙනෙන මැණික් ප්‍රමාණයට සීමාවක් පනවා නොමැත. මෙරටට ආනයනය කරන මැණික්වල වර්ගය, ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳව නිසි තක්සේරුවක් හෝ වාර්තා තබා ගැනීමක් ද දැනට සිදු නොකරයි. රට තුළට ආනයනය කරන මැණික් සඳහා දේශීය වෙළඳපොළ තුළ ඉතාමත් අවම මට්ටමක ඉල්ලුමක් පවතින බැවින් ආනයනය කරන මැණික් ගල් 100%ක්ම අගය වැඩි දියුණු කර අපනයනය කරන්නේ යැයි අනුමාන කරනු ලැබේ.

මැණික් කුරියර් ක්‍රමයට ආනයනය කිරීමේදී පමණක් මැණික්වල වටිනාකම තක්සේරු කර එම වටිනාකම මත 2.5% ක සමාජ ආරක්ෂණ බදු මුදලක් අය කරනු ලැබේ. මෙම බදු මුදල නිසා මැණික් ආනයනය කර අගය වැඩි දියුණු කර ප්‍රති-අපනයනය කිරීම තුළින් වැඩි වාසියක් ක්ෂේත්‍රයේ නිරතව සිටින ව්‍යාපාරිකයින්ට ලබාගත නොහැකි බැවින් දැනට පනවා ඇති 2.5%ක බදු මුදල රළු පිරික්සනු නොලැබූ මැණික් ගල් සඳහා ඉවත් කරන ලෙස පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වන ආංශික අධීක්ෂණ කාරක සභාවට පැමිණි මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ නිරතව සිටින ව්‍යාපාරික සංගම් නියෝජිතයෝ ඉල්ලා සිටියහ.

ශ්‍රී ලංකා රේගුව විසින් සියලුම අපනයනකරුවන් සහ ආනයනකරුවන් මාර්ගගත ක්‍රමවේදයකට අනුව ලියාපදිංචි කිරීම (Online Custom Declaration System ASYCUDA) අනිවාර්ය කිරීම සඳහා පුළුල් ව්‍යාපාරයක් දියත් කර ඇත. මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යාපාරිකයින් ද මෙම ක්‍රමවේදයේ ලියාපදිංචිය සඳහා රේගු ප්‍රකාශය රේගු නියෝජිතයා හරහා ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රමවේදය ඒකානුබද්ධ නොවන පුද්ගලානුබද්ධ විය හැකි තක්සේරු භාණ්ඩයක් වන මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන්ට ප්‍රායෝගිකව අපහසු වන අතර විවිධ අක්‍රමිකතා මෙම රාජ්‍ය නොවන නියෝජිතයා මඟින් සිදුවන බව ද එම නියෝජිතයාට අධික මුදලක් ගෙවිය යුතු බව ද ඔවුහු පෙන්වා දුන්හ.

එසේම පසුගිය වර්ෂ කිහිපයක සිට චීන ව්‍යාපාරිකයින් ලංකාවේ මැණික් ගල් ඉතා අඩු මුදලට රත්නපුරය, බේරුවල සහ ගිංතොට ආදී ප්‍රදේශවලදී මිලදී ගන්නා අතර වෙනත් රටවලට ගොස් ඉතා අධික මිලකට විකිණීම සහ මෙම ජාතිකයින් මැණික් මිලදී ගැනීමට මුදල් මෙරටට ගෙන එන ආකාරය සහ මැණික් ගල් ලංකාවෙන් ගෙනයන ආකාරය පිළිබඳව නිසි නියාමනයක් කළ යුතු ව ඇති බව ද පෙන්වා දුන්හ.

ලාභය මත බදු ගණනය කිරීම, අක්‍රමික ව්‍යාපාරයක් වන මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳාමට ද රජය අනුගමනය කරන බැවින් එහි වියදම ගණනය කිරීමට පහසුවන පරිදි 2023.04.01 දින සිට රජයේ ප්‍රතිපත්තිය අනුව රු.500,000/- වැඩි ගෙවීම් බැංකු චෙක්පතක් මඟින් සිදුකළ යුතු වේ. මෙනිසා රු.500,000/= වඩා වැඩි මුදල් ගණුදෙණු සිදු කිරීමේදී ලියාපදිංචි අපනයනකරුවන් අභිබවා බදු නොගෙවන ව්‍යාපාරිකයින් හා විදේශීය ගැණුම්කරුවන් (චීන ජාතිකයින් අයථා මුදල් උපයෝගී කර ගනිමින් රත්නපුරය, බේරුවල ආදී ප්‍රදේශවල) සියලු ගණුදෙණු අත්පිට මුදලට සිදු කරනු බැවින් ලියාපදිංචි ව්‍යාපාරිකයින්

චෙක්පත් මඟින් ගණුදෙණු කිරීමට යාමේදී ඔවුන් හා ගණුදෙණු කිරීමට විකුණුම්කරුවන් අකමැත්ත දැක්වීමෙන් ලියාපදිංචි මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර තත්ත්වය අඩපණ වී ඇත.

අප්‍රිකානු රටවලින් රත්‍රං මෙරටට ආනයනය කර ඒවා ස්වර්ණාභරණ බවට පත්කර අගය වැඩි දියුණුකර නැවත ප්‍රති-අපනයනය කළ හැකි වුවද, ඒ සඳහා සුළු හා මධ්‍යම ව්‍යාපාරිකයින්ට පහසුකම් නොමැති නිසා දැනට එම අපනයන ව්‍යාපාරය අඩාල වෙමින් පවතී.

විශේෂයෙන්ම මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යාපාරය පාරම්පරිකව පැවත එන ව්‍යාපාරයක් බැවින් ද අනෙක් ව්‍යාපාර මෙන් සම්මත ක්‍රමවේදයක් තුළ සිදුවන ව්‍යාපාරයක් නොවන බැවින් ද ඔවුන්ගෙන් ලාභය ගණනය කර බදු අය කිරීමෙන් මෙම ව්‍යාපාරයේ යෙදෙන බොහෝ ව්‍යාපාරිකයින්ට අසාධාරණයක් සිදුවන බැවින් එම ප්‍රතිපත්තිය අහෝසි කර මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යාපාරිකයින්ගේ වාර්ෂික මුළු පිරිවැටුම මත 2.5% බද්දක් අයකර ගන්නා ලෙස ඔවුහු පෙන්වා දුන්හ.

මෙවැනි වාතාවරණයක් තුළ මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාරික ප්‍රජාව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සහ ශ්‍රී ලංකා රේගුව යන ආයතනවල නිලධාරීන් සමඟ කරන ලද සාකච්ඡා මත පදනම්ව මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට සහ ලෝකයේ මෙම කර්මාන්තය ප්‍රචලිතව ඇති සෙසු රටවල් සමඟ තරඟකාරීව විදේශ විනිමය උපයා ගත හැකි ආකාරයට ක්ෂේත්‍රය දියුණු කිරීමට වන පහත සඳහන් නිර්දේශ පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වන ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට එකඟ විය.

## 2. නිර්දේශ

1. මැණික් ප්‍රති-අපනයනය සඳහා කුරියර් ක්‍රමයට ආනයනය කිරිමේදී දැනට පනවා ඇති 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බදු මුදල ඉවත් කිරීමට 2023 ජුනි මස 30 වන දින ගැසට් කරන ලද ගැසට්ටුව පාර්ලිමේන්තුවේ අනුමත කර කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස

2. මැණික් ඇසුරුම අතෙහි රැගෙන ඒම සහ නියෝජිතයකු හරහා ඇසුරුම් කුරියර් කිරීම යන ක්‍රමවේද දෙකෙහිදීම ආනයනය කරන මැණික්වල වටිනාකම පිළිබඳ තක්සේරු වාර්තාවක් ආනයනකරු තමා විසින්ම රේගුවට ලබාදිය යුතු බව (Self-Declaration the value of the Parcel)

3. ආනයනයේදී ශ්‍රී ලංකා රේගුව දැනට උපයෝගී කරගත් (TIEP -අපනයනය සඳහා තාවකාලික ආනයන) ක්‍රමවේදය මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරයට තවදුරටත් අවශ්‍ය නොවන බව

4. මැණික් ආනයනය සහ අපනයන ක්‍රියාවලියේදී රේගු නියෝජිතයෙකුගේ (Custom Handling Agent) මැදිහත් වීමකින් තොරව ඉතා සරල ආකාරයෙන් ආනයනකරු ගෙනා මැණික්වල වටිනාකම රේගුව වෙත ඉදිරිපත් කිරීමට ද මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ දැනුවත් වීමට ද ක්‍රමවේදයක් හඳුන්වා දීම

5. මැණික් සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සඳහා දැනට ක්‍රියාත්මක ලාභය මත බදු අයකරන ක්‍රමවේදය අවලංගු කර ව්‍යාපාරිකයින්ගේ මූලික පිරිවැටුම මත 2.5%ක් හෝ සුදුසු අනුපාතයක් තුළ බදු මුදලක් පැනවීම

6. මෙරටට පැමිණ ව්‍යාපාරික කටයුතුවල නිරත වන විදේශ ජාතීන්ගේ අයථා මැදිහත්වීම මැණික් ව්‍යාපාරය තුළ නියාමනය කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඒකාබද්ධව ඔවුන් සඳහා ඇමරිකානු ඩොලර් 100,000ක හෝ 50,000ක ගිණුමක් ආරම්භ කරන ලෙස ද එම ගිණුමේ ප්‍රමාණය අනුව ව්‍යාපාරික වීසා සහිත විදේශිකයින්ට, ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයකු සමඟ ඒකාබද්ධ වී කටයුතු කිරීමට මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙන් බලපත්‍රයක් ලබා දිය යුතු බව

7. දැනට විදේශ විනිමය උපයන ස්වර්ණාභරණ අපනයනකරුවන් සඳහා ඔවුන්ගේ විදේශ විනිමය ඉපැයීම් ගණනය කර එයින් 50%ක් දක්වා අමු රත්‍රං තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිර්දේශය මත අවස්ථාව ලබා දීම

8. දැනට අවිධිමත් ලෙස විදේශ විනිමය උපයන කුඩා වෙළෙඳුන්ද (Beach Shop වැනි) විදේශ විනිමය උපයන්නේ නම් ඒ අනුව වර්ගීකරණ ක්‍රමයක් හඳුන්වා දී ඉහත අංක 7හි සඳහන් පහසුකම ලබාදීමේදී ඔවුන්ව ද සැලකිල්ලට ගැනීම

9. ලෝකයේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා ශීඝ්‍රයෙන් දියුණුවන නිසා ඒ සඳහා අවශ්‍යවන විශේෂිත යන්ත්‍රෝපකරණ ශීඝ්‍රයෙන් වෙනස් වේ. ඒ අනුව ලොව තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය වන යන්ත්‍ර තීරුබදු රහිතව ගෙන ඒමට අපනයනකරුවන්ට අවස්ථාව ලබාදීම

10. එමෙන්ම කොළඹ ස්ථානගතව පවතින මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය, ප්‍රධාන ආයතනය ලෙස රත්නපුර ප්‍රදේශයේ ද එහි ශාඛාවක් බේරුවල ප්‍රදේශයේ ද ස්ථාපිත කිරීම

11. තායිලන්තය, චීනය සහ හොංකොං යන රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට අනුයුක්තව සේවය කරන වානිජ නිලධාරීන් වෙතින් එම රටවල මැණික් සහ ස්වර්ණාභරණ ආනයන අපනයන ක්‍රියාවලියේදී, අනුගමනය කරන බදු ප්‍රතිපත්ති හා අනෙකුත් ක්‍රමවේද පිළිබඳව පුළුල් අවබෝධයක් මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන්ට ලබාදීම සහ අවශ්‍ය නම් ඔවුන්ට එය ප්‍රායෝගිකව පෙන්වා දීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවන් ලබාදීම

## 3. කාරක සභාවට කැඳවන ලද රාජ්‍ය ආයතන

1. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
2. මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
3. මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ සහ අභ්‍යාස ආයතනය
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, රත්නපුර
5. ශ්‍රී ලංකා රේගුව

## 4. කාරක සභාවට කැඳවන ලද මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංගම්

1. ලංකා මැණික් ව්‍යාපාරිකයින්ගේ සහ පතල්කරුවන්ගේ මහා සංගමය, රත්නපුර
2. ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශකයින්ගේ සංගමය

3. මැණික් සහ හරිත සංගමය, රත්නපුර
4. ඔරලෝසු කණුව ළඟ මැණික් සංගමය, රත්නපුර
5. ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංගමය, කොළඹ 05
6. චීන කොටුව මැණික් සහ ස්වර්ණාභරණ සංගමය, බේරුවල

පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය පිළිබඳ

ආංශික අධීක්ෂණ කාරක සභාව

"මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට අදාල බදු ප්‍රතිපත්ති" සම්බන්ධයෙන් පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලන ලද අතර ඒ පිළිබඳ කමිටුවේ නිර්දේශ පාර්ලිමේන්තුවට ලබාදීම සඳහා ඉදිරිපත් කරන මෙම වාර්තාව කමිටුවේ සාමාජිකයන් වන අපි අනුමත කරමු.

*ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (සභාපති) ..............................

ගරු සී.බී.රත්නායක මහතා ..............................

ගරු ජයන්ත සමරවීර මහතා ..............................

ගරු ජයන්ත කැටගොඩ මහතා ..............................

*ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා ..............................

*ගරු වරුණ ලියනගේ මහතා ..............................

*ගරු අකිල එල්ලාවල මහතා ..............................

*ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා ..............................

ගරු එච්. නන්දසේන මහතා ..............................

ගරු අලි සබ්රි රහීම් මහතා ..............................

*ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතා ..............................

*ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා ..............................

..............................

ඩී.සී.එස්. රූපසිංහ මිය, කාරක සභාවේ ලේකම් වෙනුවට

(*කාරක සභා සාමාජිකයෝ මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සම්බන්ධව සාකච්ඡා කරන ලද කාරක සභා රැස්වීම්වලට සහභාගී වූහ.)